# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1416/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திக / Date – 01/09/2024 පැය 1930

## මාධ්‍ය නිවේදනය

### පොලිස් විශේෂ කාර්ය බලකාය 40 වන රණවිරු සැමරුම් උත්සවය පැවැත්වීම.

පොලිස් විශේෂ කාර්ය බලකාය 40 වන රණවිරු ගුණසැමරුම් උත්සවය 2024.09.01 වන අද දින උදැසන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති පරිපාලන ( වැඩබලන) ලලිත් පතිනායක මහතා සහ පොලිස් විශේෂ කාර්ය බලකා අණදෙන නිලධාරි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වරුණ ජයසුන්දර මහතාගේ ප්‍රධානත්වයෙන් කටුකුරුන්ද පොලිස් විශේෂ කාර්ය බලකා පුහුණු පාසලේ දී පැවැත්විණි.

1984 වසරේ සැප්තැම්බර් මස 01 වන දින යාපනය ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් ගමන් ගත් ට්‍රක් රථයක් එල්.ටී.ටී.ඊ සංවිධානය විසින් අටවන ලද බෝම්බයකට හසුව නිලධාරින් සිව් දෙනෙකු මියයාම හා තවත් එකොළොස් දෙනෙකු තුවාල ලැබීමේ සිද්ධිය ඇතුළු මාතෘ භූමිය වෙනුවෙන් දිවි පිදූ පොලිස් විශේෂ කාර්ය බලකායේ සියළු නිලධාරින් සිහිපත් කිරීම වෙනුවෙන් සෑම වසරකම සැප්තැම්බර් මස 01 වන පොලිස් විශේෂ කාර්ය බලකා රණවිරු දිනය සමරනු ලබයි.

උතුරු නැගෙනහිර පැවති ත්‍රස්තවාදී යුද්ධයේ දී පොලිස් විශේෂ කාර්ය බලකායේ රණවිරුවන් 464 දෙනෙකු සහ සිවිල් සේවකයින් 06 දෙනෙකු මාතෘ භූමියේ භෞමික අඛණ්ඩතාවය සහ සෛවරීභාවය වෙනුවෙන් දිවි පුදා ඇති අතර, රණවිරුවන් 774 දෙනෙකු තුවාල හා පූර්ණ ආබාධිත බවට පත්ව ඇත.

මාතෘ භූමිය වෙනුවෙන් දිවිපිදූ සෑම පොලිස් විශේෂ කාර්ය බලකා රණවිරුවකුම මෙහිදී සිහිපත් කරන ලද අතර, මෙම අවස්ථාවට සමගාමීව රණවිරු පවුල් වල අධ්‍යාපනය ලබන දූවා දරුවන් වෙත පාසල් උපකරණ බෙදා දීමක් ද සිදු කරන ලදි.

මෙම අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක්


SRI LANKA POLICE
OFFICIAL FACEBOOK PAGE


SRI LANKA POLICE
OFFICIAL FACEBOOK PAGE


SRI LANKA POLICE
OFFICIAL FACEBOOK PAGE


SRI LANKA POLICE
OFFICIAL FACEBOOK PAGE


SRI LANKA POLICE
OFFICIAL FACEBOOK PAGE


SRI LANKA POLICE
OFFICIAL FACEBOOK PAGE







**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**